**ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය - 2023**

**-----------------------------------------------------------------**

ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425 එස්ආර්අයි (එස්එෆ්) දරණ ණය ගිවිසුමේ වගන්තියෙහි සඳහන් විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුමට අනුව, එවකට වරාය සහ මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශක්‍යතා අධ්‍යයනය, විස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන ලේඛන පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ආරම්භක අදියර තුළදී ක්‍රියාත්මක කිරීමේ සහාය ලබා දීම මඟින් මාර්ග, දුම්රිය හා වරාය යන උප අංශවල ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘතිවල ආරම්භක කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් මාර්ග, දුම්රිය සහ වරාය යන සංරචක තුනක් (03) යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වි.ගැ.හි. මිලියන 17.471 කට සමාන එ.ජ.ඩො මිලියන 27.7 ක් වන අතර ඉන් එ.ජ.ඩො. මිලියන 24.42 කට සමාන රු. මිලියන 3,655.43 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 28 දින ආරම්භ කරන ලද අතර, 2023 ජුනි 30 දින වන විට ව්‍යාපෘතියේ මාර්ග සංරචකයේ වැඩ අවසන් කර ඇත.

### 1.3 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

| අංකය | නීති,රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි 58 සහ 59 වගන්ති | ව්‍යාපෘතිය භෞතිකව නිම කළ දින සිට මාස 06 ක් ඇතුළත මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති අවසන් වාර්තාව ආසියානු සංවර්ධන බැංකුවට (ආ.සං.බැ.) ලබා දිය යුතුය. කෙසේ වෙතත්, එවැනි වාර්තාවක් ආසියානු සංවර්ධන බැංකුව වෙත ලබාදීමට මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා කටයුතු කර නොතිබුණි. | ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතියේ අවසන් වාර්තාව සකස් කර ආසියානු සංවර්ධන බැංකුව වෙත විධිමත් ලෙස ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල් වෙත භාර දී ඇත. | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි දක්වා ඇති පරිදි ව්‍යාපෘති අවසන් කිරීමේ වාර්තාව ඇතුළු අනෙකුත් ලියකියවිලි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.** **භෞතික කාර්යසාධනය**

**3.1** **ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ඒකක/සියයට | ලඟාකරගත් කාර්යසාධනය ඒකක/සියයට | | |
| ජාත්‍යන්තර ඒක පුද්ගල ප්‍රසම්පාදන උපදේශක ආයතනයක් | උපදේශන කටයුතු | 100 | 75 | කොන්ත්‍රාත්කරු විසින් වැඩ නිම කර නොතිබුණු අතර මෙම කාර්යය සඳහා ගෙවන ලද රු. මිලියන 17.36 ක මුදල ව්‍යාපෘතිය අවසානයේ ඵල රහිත වී තිබුණි. | නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුණු මත දිවෙන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අත්හිටුවීමට රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා ගත් තීරණය. |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

පුද්ගල ප්‍රසම්පාදන උපදේශක ව්‍යාපාර ප්‍රසම්පාදන උපදේශකගේ මැදිහත්වීම තවදුරටත් අවශ්‍ය නොවීය. එබැවින්, නොවැළැක්විය හැකි තත්වයන් හේතුවෙන් පුද්ගල ප්‍රසම්පාදන උපදේශකගේ සේවය අත්හිටුවීම සාධාරණ වනු ඇත.

**විගණකගේ නිර්දේශය**

උපදේශන කටයුතු නියමිත කාලය තුළ අවසන් කිරීමට කටයුතු කළ යුතු අතර එකිනෙකට සම්බන්ධිත සංරචක එක් ව්‍යාපෘතියක් යටතේ ක්‍රියාත්මක කිරීමටද කටයුතු කළ යුතුය.

**3.2 ඌන උපයෝජිත වත්කම්**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආසියානු සංවර්ධන බැංකුව විසින් මාර්ග සංරචකය සඳහා එ.ජ.ඩො. මිලියන 10 ක මුදලක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් වන තෙක් ව්‍යාපෘති කළමණාකරන ඒකකය විසින් එ.ජ.ඩො. මිලියන 2.55 ක් පමණක් භාවිතා කර තිබුණි. | පිළිගනිමි.<br>**ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම්** ව්‍යාපෘතියේ මාර්ග සංරචකය මුලිකව සමන්විත වූයේ අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සහ SASEC Port Elevated Highway ව්‍යාපෘතිය සඳහා නිර්මිත සැකසීම විය. කෙසේ වෙතත්, අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ මූලික හා සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සැකසීම ඉහළ ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන නොතිබුණි. එබැවින්, එ.ජ.ඩො. මිලියන 10 න් එ.ජ.ඩො. මිලියන 6.9 ක වටිනාකමක් සහිත ප්‍රධාන සංරචකය ක්‍රියාත්මක කර නොතිබුණි. | ණය මුදල් කාර්යක්ෂමව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 පෙබරවාරි මාසයේදී ආ.සං.බැ. විසින් සිදු කරන ලද මධ්‍ය කාලීන සමාලෝචනයට (Mid - term Review Mission) අනුව, ඉතිරි සහනදායී ණය ශේෂය භාවිතා කිරීම සඳහා අදාල නව කාර්යය පැවරුම් පිළිබඳ විස්තර සැපයීමට රජය සූදානම් වන තෙක් ණය මුදල පවත්වාගෙන යාමට සමාලෝචනයේදී අපේක්ෂා කෙරිණි. එසේ කිරීමට මහා මාර්ග අමාත්‍යාංශය හා මාර්ග සංවර්ධන අධිකාරිය එකඟ වී තිබුණද, ව්‍යාපෘතිය අවසන් වන තුරු නව පැවරුම් සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. එබැවින්, එ.ජ.ඩො. මිලියන 7.45 ක සහනදායී ණය ශේෂය ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර ව්‍යාපෘති කළමණාකරන ඒකකය වසා දැමීමේදී ආපසු ගෙවා තිබුණි. | පිළිගනිමි.<br>ව්‍යාපෘති යෝජනාවක් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ (NPD) අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර එය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2022 ජනවාරි 20 දින අනුමත කර තිබුණි.<br>කෙසේ වෙතත්, ජාතික අයවැය චක්‍රලේඛ අංක. 03/2022 අනුව නව පැවරුම් සහ යෝජනා ක්‍රියාත්මක නොවුණි. | මාර්ග අංශයේ සැබෑ අවශ්‍යතාවයන් සඳහා විදේශ ණය ලබාගතයුතු අතර හඳුනාගත් වැඩ අදාළ ණය මුදල තුළ නිම කිරීමට කටයුතු කළ යුතුය. |